# පළාත් සභා නිවේදන

අංක ව්/පස/2/1/19(33).

## වයඹ පළාත් සභාව

## 2003 අංක 06 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2003.12.16 වැනි දින සම්මත කරන ලදුව, 2004.03.29 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පළකරමි.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2004 මැයි මස 19 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

(වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය 2004.03.29)

### වයඹ පළාත් සභාවේ 2003 අංක 6 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ (සංශෝධන) ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 11 දරන කර්මාන්ත සේවා කාර්යාංශ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය.

1. මෙම ප්‍රඥප්තිය 2003 අංක 06 දරන වයඹ කර්මාන්ත සේවා කාර්යාංශ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ලං) වගන්තියට තදනන්තරව (ඪ) වශයෙන් පහත සඳහන් උපවගන්තිය ඇතුලත් කිරීමත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ඪ) කාර්යාංශයේ තිරසාර භාවය සහ ඉදිරි පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ත් ඊ තුළින් ඉහතින් සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහාත්, පළාත තුළ ද, පළාතෙන් පිටද, දිවයිනෙන් බැහැරව ද ආදායම් ඉපයීමේ කර්තව්‍යයන් හි නියැලීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වැනි වගන්තියේ (ඪ) උප වගන්තියට ඉක්බිතිවම මතු දැක්වෙන උප වගන්ති 6(ම) සහ 6(ඹ) වශයෙන් ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ම) කාර්යාංශයේ අරමුණු ඉටුකර ගැනීමේ දී යම් නිශ්චල දේපලක් හෝ ඉඩම් පවරා ගැනීමක් හෝ සිදු කරනු පිණිස අවශ්‍ය වන මුදල් කාර්යාංශය මගින් දැරීම.

(ඹ) පළාතෙන් පිටත දී හෝ විදේශ රටකදී හෝ කාර්යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියා කිරීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

4. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

06-251